
## ඇතැම් ඉඩම් විකිණීම මත බදු ක්‍රියාවට නැංවීමේ ක්‍රියාවලිය



**09.1 හැඳින්වීම**

පළාත් පාලන ආයතන බල ප්‍රදේශය ඇතුළත පිහිටි යම් ඉඩමක් වෙන්දේසිකරුවකු හෝ තැරැව්කරුවකු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජිතයා විසින් විකිණීම කරනු ලබන අවස්ථාවක, ඒ ඉඩම විකිණීමෙන් ලැබෙන සම්පූර්ණ මුදලෙන් සියයට එක(1%)කට සමාන මුදලක් අදාළ පළාත් පාලන ආයතනයට බද්දක් වශයෙන් ගෙවිය යුතුය.

**09.2 නෛතික අධිකාරිය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වන වගන්තිය

**09.3 සුදුසුකම්**

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි කිසියම් ඉඩමක් විකිණීම කරන වෙන්දේසිකරුවකු හෝ තැරැව්කරුවකු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජිතයා විසින් මෙම බද්ද ගෙවීමට යටත් වනු ඇත.

සටහන: i. කිසියම් වාණිජ බැංකුවක් විසින් හෝ වෙනත් යම් මූල්‍ය ආයතනයක් විසින් යම් ඉඩමක් හෝ නිවසක් සහිත ඉඩමක් උකසට ගෙන ණය මුදලක් ගෙවා තිබිය දී, අදාළ ණය මුදල ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවක ඒ ණය මුදල අය කර ගැනීමේ කාර්යය සඳහා අදාළ බැංකුවට හෝ මූල්‍ය ආයතනයට පැවරී ඇති ඇටෝර්නි බලය අනුව ඒ බැංකුව හෝ මූල්‍ය ආයතනය විසින් ඒ ඉඩම ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරනු ලැබීමේ දී, ඒ වෙන්දේසිය සිදුකරන වෙන්දේසිකරු විසින් විකිණීමට තීන්දු කරනු ලැබූ මුදලෙන් සියයට එකකට සමාන ප්‍රමාණය වශයෙන් මේ බද්ද ඒ වෙන්දේසිකරුගෙන් අය කර ගත යුතු ය.

ii. ඉහත සඳහන් යම් වෙන්දේසියකදී ඉඩම මිල දී ගැනීමට ගැනුම්කරුවකු ඉදිරිපත් නොවන විටක, බැංකුව හෝ මූල්‍ය ආයතනය විසින් ඒ ඉඩම මිල දී ගැනීමට ක්‍රියා කරන අවස්ථා පවතී. එවැනි අවස්ථාවක වුව ද මේ බද්ද ගෙවීමට වෙන්දේසිකරු හෝ තැරැව්කරුවකු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජිතයා යන්නට අදාළ බැංකුව හෝ මූල්‍ය ආයතනය අදහස් වේ.

iii. යම් අධිකරණයක් විසින් කරනු ලබන විධානයක් මත අධිකරණයේ පිස්කල් විසින් යම් දේපළක් වෙන්දේසි කිරීම සිදු කරන අවස්ථාවක දී ද, මේ බද්ද අය කර ගත යුතු අතර අදාළ පිස්කල් වෙන්දේසිකරු වශයෙන් සැලකිය යුතු ය.

**09.4 ගාස්තුව**

අදාළ ඉඩම විකිණීමෙන් ලබාගත් සම්පූර්ණ මුදලෙන් සියයට එකක් (1%) බද්ද වශයෙන් ගෙවිය යුතුය.

සටහන: ඇතැම් වෙන්දේසිකරුවන් හෝ තැරැව්කරුවකු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජිතයා විසින් ඉඩම විකුණනු ලැබූ මුදලේ වටිනාකම අඩුවෙන් පෙන්වා දෙමින් ඔප්පු පිළියෙළ කරනු ලබන අවස්ථා තිබිය හැකිය. එවැනි අවස්ථා අනාවරණය කර ගැනීම සඳහා පළාත් ආදායම් දෙපාර්තමේන්තුවෙන් ඒ වටිනාකම පිළිබඳ තහවුරු කර ගැනීම ලේකම්වරයාගේ කාර්යය විය යුතුය.

## 09.5 බද්ද අයකර ගැනීමේ කාර්යය පටිපාටිය

| අනු අංකය | පටිපාටිය | කාල සීමාව | අධිකාරය |
|---|---|---|---|
| 1 | බල ප්‍රදේශය ඇතුළත පිහිටි යම් ඉඩමක් හෝ ඉඩම් වෙන්දේසිකරුවකු හෝ තැරැව්කරුවකු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජිතයා මඟින් විකිණීම කරන අවස්ථා නිරීක්ෂණය කර හඳුනාගැනීම | නිරන්තර විමර්ශනය හා නිරීක්ෂණය මඟින් (වෙළෙඳ දැන්වීම්, ප්‍රචාරක දැන්වීම්, ඉඩම් අනු බෙදුම් අනුමතය ඉල්ලීම් සහ වෙන්දේසිකරුවන්ගේ අන්තර්ජාල වෙබ් අඩවි, අන්තර්ජාල මුහුණු පොත් පරීක්ෂාව) | ආදායම් පරීක්ෂක ඇතුළුව, ආදායම් විෂය හා සම්බන්ධ සියලුම නිලධාරීන් සහ ලේකම් |
| 2 | විකුණන ඉඩම් පිළිබඳ විස්තර මාසිකව නොතාරිස්වරුන්ගෙන් හෝ ඉඩම් රෙජිස්ටාර් මඟින් ලබාගැනීම | මාසිකව | ලේකම් |
| 3 | එවැනි විකිණීමක් පිළිබඳ ව ලේකම්ට වාර්තා කිරීම / ලේකම් විසින් හඳුනාගැනීම. | අනාවරණය කර ගත් අවස්ථාවේදීම | පෙරටු කාර්යාල නිලධාරි / ආදායම් පරීක්ෂක / ආදායම් විෂය භාර නිලධාරි |
| 4 | ගෙවිය යුතු බදු මුදල සඳහන් කරමින් අදාළ තැනැත්තාට බදු නිවේදනය නිකුත් කිරීම | අනාවරණය කර ගත් අවස්ථාවේදීම | ලේකම් |
| 5 | බදු මුදල අය කර ගෙන ලදුපතක් නිකුත් කිරීම | | පෙරටු කාර්යාල නිලධාරි / මුදල් අයකැමි |

## 09.6 බදු මුදල ගෙවීම පැහැර හැර ඇති විට කාර්යය පටිපාටිය

| අනු අංකය | පටිපාටිය | කාල සීමාව | අධිකාරය |
|---|---|---|---|
| 1 | බදු මුදල ගෙවීම පැහැර හැර ඇති තැනැත්තාට ඒ පිළිබඳ සිහි කැඳවීම | බදු මුදල ගෙවීම සඳහා බදු නිවේදනය භාර දුන් දිනෙන් දින හතක් පසු වූ වහාම | ලේකම් |
| 2 | සිහි කැඳවීමට අනුගත නොවන්නේ නම් මහේස්ත්‍රාත් අධිකරණයේ ඉල්ලීමක් ගොනු කිරීම | සිහි කැඳවීමේ දින සිට දින හතක් පසු වූ වහාම | ලේකම් |
| 3 | අය විය යුතු බද්ද, දඩයක් වශයෙන් අය කිරීමට නියෝග නිකුත් කිරීම | | මහේස්ත්‍රාත් |